දෙල්ගොඩ නේවාසිකාගාරයක පදිංචිව සිටි දැරියක් සමූහ අපයෝජනයට ලක් කිරීමේ සිදුවීමක් සම්බන්ධයෙන්, මාධ්‍ය තුළ වාර්තා වී තිබිණි. එහිදී, අද, දිනමිණ සහ මව්බිම පුවත්පත් (මාර්තු 06, 2023) මෙම පුවත තුළ අදාළ වරදට අත්අඩංගුවට ගැනුණු පිරිස සම්බන්ධයෙන් වාර්තා කර තිබුණේ මේ අයුරිනි.
අද - "මුස්ලිම් ජාතික ව්‍යාපාරිකයෙකු ඇතුළු..."
දිනමිණ - "මුස්ලිම් ජාතික ව්‍යාපාරිකයෙකු ඇතුළු..."
මව්බිම - "ව්‍යාපාරිකයෙකු ඇතුළු..."
පුවතකට අදාළ නොවන වාර්ගිකත්වයන් ඉස්මතු කොට නොදක්වන මෙන්, මාධ්‍ය මාර්ගෝපදේශයන් උපදෙස් දෙයි. මන්ද යත්, අදාළ නොවන වාර්ගිකත්වයන් සෘණාත්මක සන්දර්භයන් තුළ ඉස්මතු කිරීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් සෘණාත්මකව ඒකාකෘතික වීමට ඉඩ ඇති බැවිනි.
ඔබ සිතන ආකාරයට,
1) අත්අඩංගුවට ගත් සය දෙනෙකු අතුරින්, එක් අයෙකුගේ පමණක් වාර්ගිකත්වය "මුස්ලිම්" යැයි ඉස්මතු කෙරී ඇත්තේ මන්ද? අත්අඩංගුවට ගැනුණු අනෙකුත් අයවලුන්ගේ වාර්ගිකත්වයන් පුවත තුළ සඳහන් නොවන්නේ මන්ද?
2) එසේ නම්, එම එක් අයෙකුගේ වාර්ගිකත්වය පමණක් පුවතට අදාළ වන්නේ කෙසේද?
3) මව්බිම පුවත කිසිදු වාර්ගිකත්වයක් ඉස්මතු කොට නොදක්වමින් මේ පිළිබඳව වාර්තා කර තිබේ නම්, අද සහ දිනමිණ පුවත්පත් එසේ කර නොමැත්තේ මන්ද?
( තෝරාගත් දමිළ භාෂා පුවත්පත් තුළ, මෙදින, මෙම සිදුවීම පිළිබඳව වාර්තා වී නොතිබුණි.)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

